# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2026 අගෝස්තු මස 07 වන දින**

**II වන කොටස**

## අතිරේකය

(2026.08.07 දින නිකුත් කරන ලදී)

## විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. **14.50**

තැපැල් ගාස්තුව : රු. **150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එල්. ඩී.- ඕ. 24/2026

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස හඳුන්වනු ලැබේ.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

> "(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට හත වන අතර, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට පහ වන්නේ ය:
>
> එසේ වුව ද, අග්‍රවිනිශ්චයකාරවරයා විශ්‍රාම ගත යුතු දිනය, ඔහු වයස අවුරුදු හැට හතට එළඹෙන දිනය හෝ ඔහු අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් වන දිනයේ සිට වසර හයක කාලසීමාවක් සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය වන්නේ ය.".

*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම*

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 137 වන ව්‍යවස්ථාවේ "දහනව දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන වෙනුවට "විසිහතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

PL 15891 - 465 (2026/08)